(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 93. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2021 සැප්තැම්බර් 07 අඟහරුවාදා පූ. භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** විදේශ අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා, සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍යතුමා සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **බැසිල් රෝහණ රාජපක්ෂ මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** ප්‍රවාහන අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් නිවාඩ් කබ්රාල් මහතා,** මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා

ගරු කපිල අතුකෝරල මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු සම්පත් අතුකෝරල මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෙයි අරසන් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු නසීර් අහමඩ් මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු ගයාෂාන් නවනන්ද මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු  සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු  ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු  (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු  රෝහණ බංඩාර මහතා

ගරු  ශාන්ත බණ්ඩාර මහතා

ගරු  රිසාඩ් බදියුදීන් මහතා

ගරු  සුදත් මංජුල මහතා

ගරු  එස්. එම්. මරික්කාර් මහතා

ගරු  කේ. කාදර් මස්තාන් මහතා

ගරු  ඉම්රාන් මහරූෆ් මහතා

ගරු  ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු  අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු  එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු  මොහමඩ් මුසම්මිල් මහතා

ගරු  අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු  වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු  පාඨලී චම්පික රණවක මහතා

ගරු  නිපුණ රණවක මහතා

ගරු  බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු  (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු  කුමාරසිරි රත්නායක මහතා

ගරු  අලි සබ්රි රහීම් මහතා

ගරු  ඉෂාක් රහුමාන් මහතා

ගරු  මුජිබුර් රහුමාන් මහතා

ගරු  (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු  හර්ෂණ රාජකරුණා මහතා

ගරු  අජිත් රාජපක්ෂ මහතා

ගරු  ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු  (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු  උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු  ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු  ගාමිණී වලේබොඩ මහතා

ගරු  ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු  රනිල් වික්‍රමසිංහ මහතා

**ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය**

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**

**ගරු මධුර විතානගේ මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු මහින්ද සමරසිංහ මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු රවුෆ් හකීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112හි විධිවිධාන සහ 2021 අගෝස්තු 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේදී ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම පිණිස මතු සඳහන් මන්ත්‍රීවරයන් තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි:-

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා

ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා"

**II**

"දැනට පවතින අමාත්‍යාංශයන්හි විෂය පථයට නොගැනෙන රාජ්‍ය ආයතන විසින් පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබන විෂයයන් සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සේවය කිරීම පිණිස අග්‍රාමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් යුතුව මතු සඳහන් මන්ත්‍රීවරයන් තේරීම් කාරක සභාව විසින් පත් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි:-

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු එම්. යූ. එම්. අලි සබ්රි මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා"

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) මහාමාර්ග අමාත්‍යවරයා විසින් (469 අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වගන්තිය සමඟ කියවිය යුතු 22අ වගන්තිය යටතේ වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අගෝස්තු 19 දිනැති අංක 2241/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා එම නියෝග, වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජූලි 31 දිනැති අංක 2238/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි ඉදිරිපත් කර එම රෙගුලාසි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(6) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(7) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා සංචාරක අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(8) අධිකරණ අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) යක්කල, අලුත්ගමවත්ත, 7 වන පටුමග, අංක 92/1සී දරන ස්ථානයෙහි පදිංචි එම්. වී. ඩබ්ලිව්. කුමාරි මහත්මියගෙන් ලැබුණු 2021.05.19 දිනැති පෙත්සම ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මාතර, රාහුල හංදිය, වෙලේගොඩ පාර, අංක 7ඩී දරන ස්ථානයෙහි පදිංචි ඒ. එල්. ආරියවංශ මහතාගෙන් ලැබුණු 2021.05.10 දිනැති පෙත්සම;

(ii) පාලටුව, මාලිම්බඩ, අරලිය පෙදෙස, අංක 139/බී දරන ස්ථානයෙහි පදිංචි අයි. ජී. කමණී මහත්මියගෙන් ලැබුණු 2021.05.11 දිනැති පෙත්සම;

(iii) වැලිගම, වල්ලිවල, පරණ ගාලු පාර, අංක 135 දරන ස්ථානයෙහි පදිංචි එම්. පී. එම්. නිහාල් මහතාගෙන් ලැබුණු 2021.04.06 දිනැති පෙත්සම; සහ

(iv) දෙහිවල, අනගාරික ධර්මපාල මාවත, අංක 170/01 දරන ස්ථානයෙහි පදිංචි සුදත් කොඩිතුවක්කු ආරච්චි මහතාගෙන් ලැබුණු 2021.07.02 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) ගම්පහ, මොරගොඩ, අංක 19/ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්. එම්. පාලිත ධනපාල මහතාගෙන් ලැබුණු 2021.01.09 දිනැති පෙත්සම ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා විසින් පිළිගන්වන ලදී

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 3 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2021 සැප්තැම්බර් 21 අඟහරුවාදා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි මුදල් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(අ.භා.1.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වැවිලි අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.42 ට ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.19 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය"යි මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 3 සිට 13 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ලුහුඬු නාමය 1. මේ පනත 2021 අංක ........ දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

2 වැනි වගන්තියේ සිට 8 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

9 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 6 වැනි පිටුවේ 1 සිට 10 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(2) කොමිෂන් සභාවේ සාමාජිකයකු දිගටම ධුරයේ කටයුතු කිරීම කොමිෂන් සභාවේ සහපතට අනර්ථදායක වන්නේ නම්, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පල කරනු ලබන නියමයක් මඟින්, ඔහු සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කිරීමෙන් ඉවත් කරනු ලැබිය හැකි ය."."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10 වැනි වගන්තියේ සිට 17 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

18 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 12 වැනි පිටුවේ 32 සහ 33 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කොමිෂන් සභාවේ යම් නිලධරයකුට හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට කොමිෂන් සභාව වෙනුවෙන් කොමිෂන් සභාව".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

19 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 14 වැනි පිටුවේ 10 සිට 21 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා දිගටම සිය ධුරයේ කටයුතු කිරීම කොමිෂන් සභාවේ යහපතට අනර්ථදායක වන්නේ නම්, ඔහුව ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

20 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 16 වැනි පිටුවේ 28 සහ 29 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''අතර ගිවිසුමක් මත අවුරුදු තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා අනුයුක්ත කිරීමට යෝජනා''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

21 වැනි වගන්තියේ සිට 30 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

31 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 30 වැනි පිටුවේ 3 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''විනිමය ස්ථානය විසින් ඒ සඳහා කොමිෂන් සභාවේ සහ මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමතය''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

32 වැනි වගන්තියේ සිට 42 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

43 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 44 වැනි පිටුවේ 25 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''යම් ලිඛිත නීතියක විධිවිධාන සමඟ අනනුකූලතාවයක් තිබීම පමණින්''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

44 වැනි වගන්තියේ සිට 52 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

53 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 52 වැනි පිටුවේ 1 සිට 7 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"අපරාධ හා සිවිල් වගකීමෙන් ආරක්ෂාව

53. (1) යම් තැනැත්තකු විසින් පැහැර හැරීමේ නඩු කටයුත්තක දී සිදු කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් වන අපරාධ හෝ සිවිල් නඩු කටයුත්තකදී, බලපත්‍රලත් නිශ්කාශනාගාරයක පැහැර හැරීමේ රීති යටතේ වන බලතල පැවරීම ප්‍රකාරව තම කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් හෝ ඒ බැඳීම ඉටු කිරීම හෝ කරන ලදැයි කියනු ලබන එම බැඳීම ඉටු කිරීම අතරතුර හෝ ඒ හා සම්බන්ධයෙන් සියලු සාධාරණ සැලකිල්ල දක්වනු ලැබූ බව ද සද්භාවයෙන් ක්‍රියා කරනු ලැබූ බව ද ඔප්පු කිරීම විත්ති වාචකයක් විය යුතු ය.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

54 වැනි වගන්තියේ සිට 66 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

67 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 65 වැනි පිටුවේ 16 සිට 18 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"67. (1) යම් තැනැත්තකු විසින් 66 වන වගන්තියේ විධිවිධාන".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

68 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 68 වැනි පිටුවේ 21 සිට 23 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(III) එකී පත් කිරීමට පෙරාතුව ම වූ අවුරුදු තුනක කාල සීමාව ඇතුළත, මේ පනත යටතේ කොමිෂන් සභාවේ යම් පරිපාලනමය දණ්ඩනයකට යටත්ව ඇත්නම්;".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 68 වැනි පිටුවේ 28 සිට 30 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 69 වැනි පිටුවේ 1 සිට 32 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

69 වැනි වගන්තිය සහ 70 වැනි වගන්තිය සභා සම්මත විය.

71 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 71 වැනි පිටුවේ 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"අතරතුර".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

72 වැනි වගන්තිය සහ 73 වැනි වගන්තිය සභා සම්මත විය.

74 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 73 වැනි පිටුවේ 22 සිට 25 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

75 වැනි වගන්තියේ සිට 79 වගන්තිය දක්වා සභා සම්මත විය.

80 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනය: 76 වැනි පිටුවේ 11 සිට 28 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"සුරැකුම්පත් සම්බන්ධයෙන් වන මහජන අර්පණය

80. (1) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද තැනැත්තකු විසින් එය අනුමත කර ඇත්නම් මිස, විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමක් ලබා ගැනීමට ඉල්ලීමක් කර ඇති පොදු සමාගමක් විසින් හෝ වෙනත් ලැයිස්තුගත පොදු සමාගමක් විසින් මහජනයාගෙන් අරමුදල් ඉල්ලීමේ කාර්යය සඳහා සංස්ථා ප්‍රකාශයක් හෝ ඒ හා සමාන ලේඛනයක් මඟින් හෝ අන්‍යාකාරයකයින් කෙලින්ම හෝ තුන්වන පාර්ශ්වයක් මඟින් සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදු කරනු නොලැබිය යුතු ය.

එසේ වුව ද, සුරැකුම්පත් ප්‍රමාණය, සුරැකුම්පත් පන්තිය, ආයෝජකයන් සංඛ්‍යාව සහ වර්ගය, නිකුත් කරන්නාගේ ස්වභාවය හෝ සුරැකුම්පත් වෙළෙඳපොළේ ස්වභාවය සැලකිල්ලට ගෙන, කොමිෂන් සභාව විසින්, ලැයිස්තුගත නොකළ සමාගම්වල ඇතැම් මහජන අර්පණ වර්ගවලට පෙර කොමිෂන් සභාවේ අනුමතය ලබා ගන්නා ලෙස, මේ පනත යටතේ සාදනු ලබන රීති මඟින් නියම කරනුලැබිය හැකි ය.".

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 77 වැනි පිටුවේ 1 සිට 12 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

81 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 77 වැනි පිටුවේ 13 සිට 19 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

| | |
|---|---|
| ''සුරාකුම්පත් නිකුත් කිරීම සඳහා වන කොමිෂන් සභාවේ අනුමතය | 81. (1) ලැයිස්තුගත පොදු සමාගමක් විසින්-''. |

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 78 වැනි පිටුවේ 4 සිට 6 දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

82 වැනි වගන්තියේ සිට 84 වැනි වගන්තිය සභා සම්මත විය.

85 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 82 වැනි පිටුවේ 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ලැයිස්තුගත කරන ලද බවට අවස්ථානුගත''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 82 වැනි පිටුවේ 13 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''විෂමාචාරයකට වරදකරු වී ඇති බවට''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 82 වැනි පිටුවේ 21 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ඇති බවට අවස්ථානුගත කරුණු පවතින"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

86 වැනි වගන්තියේ සිට 96 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

97 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 92 වැනි පිටුවේ 27 සිට 31 දක්වා වන පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කොමිෂන් සභාවේ ලියාපදිංචි වීම සඳහා වන නියමය

97. (1) කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ අතරමැදියකු සඳහා හෝ වෙළෙඳපොළ අතරමැදියකු වෙනුවෙන් ගනුදෙනුකරුවන් සමඟ ගනුදෙනු කරන්නා වූ යම් තැනැත්තකුට කොමිෂන් සභාවේ ලියාපදිංචි වන ලෙස රීති මඟින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි අතර, ඒ කාර්යය සඳහා එම තැනැත්තා ලියාපදිංචි තැනැත්තකු ලෙස හඳුන්වනු ලැබිය යුතු ය.".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

98 වැනි වගන්තියේ සිට 111 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

112 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 104 වැනි පිටුවේ 6 සිට 14 දක්වා වන පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"නිර්දේශ සම්බන්ධයෙන් වන වගකීම

112. (1) යම් වෙළඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු විසින් එකී ගනුදෙනුකරුට එකී නිර්දේශය ඉදිරිපත් කිරීම සඳහා වෙළෙඳපොළ අතරමැදියට හෝ ලියාපදිංචි තැනැත්තාට සාධාරණ පදනමක් නොමැති නම්, එකී නිර්දේශය පිළිබඳව විශ්වාසය තබන බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි යම් ගනුදෙනුකරුවකුට සුරැකුම්පත් සම්බන්ධයෙන් යම් නිර්දේශයක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු ය.".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 104 වැනි පිටුවේ 28 සිට 32 දක්වා වන පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 105 වැනි පිටුවේ 1 සිට 32 දක්වා වන පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 106 වැනි පිටුවේ 1 සිට 5 දක්වා වන පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

113 වැනි වගන්තියේ සිට 117 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

118 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 110 වැනි පිටුවේ 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "යටත්ව වෙළෙඳපොළ මෙහෙයුම්කරුවකු 117 වන වගන්තිය යටතේ වන ලියාපදිංචි කිරීමෙන් නිදහස්".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

119 වැනි වගන්තියේ සිට 124 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

125 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 114 වැනි පිටුවේ 11 සිට 14 දක්වා වන පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "පනතේ විධිවිධාන ලැයිස්තුගත සුරැකුම්පත්වලට අදාළ වීම
>
> 125. මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් නොකළ හෝ පිළිගත්",

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

126 වැනි වගන්තිය සභා සම්මත විය.

127 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 115 වැනි පිටුවේ 9 වන සහ 12 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''වගන්තියට අනුකූලව සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදු කර ඇති යම් ලැයිස්තුගත පොදු සමාගමක හෝ යම් ලැයිස්තුගත නොකළ සමාගමක සුරැකුම්පත්වලට අදාළව''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 115 වැනි පිටුවේ 15 සිට 19 වන දක්වා වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''(ii) 80 වන වගන්තියට අනුකූලව සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයක් සිදු කර ඇති ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද හෝ ව්‍යාපාර කටයුතු කරගෙන යන යම් ලැයිස්තුගත පොදු සමාගමක හෝ යම් ලැයිස්තුගත නොකළ සමාගමක''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 115 වැනි පිටුවේ 27 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''(iv) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයුම්කරුවක් විසින් මෙහෙයවනු ලබන වේදිකාවට වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත් සම්බන්ධයෙන් ඇතිවන ක්‍රියාවලට හෝ මඟහැරීම්වලට; සහ''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

128 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 116 වැනි පිටුවේ 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''ස්ථානයක් මත හෝ පිළිගත් වෙළඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන වේදිකාවක් මත වෙළඳාම් කරන සුරැකුම්පත් ''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 117 වැනි පිටුවේ 21 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> ''(අ) ඔහු එම ක්‍රියාව සිදු කළ අරමුණු වූයේ විනිමය ස්ථානයක හෝ පිළිගත් වෙළඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන වේදිකාවක් මත''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 118 වැනි පිටුවේ 28 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ආ) විනිමය ස්ථානයක හෝ පිළිගත් වෙළඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙවනු ලබන වේදිකාවක් මත සක්‍රීය වෙළඳාම් කිරීමක් සිදු වන".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

129 වැනි වගන්තිය

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 118 වැනි පිටුවේ 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ලද විනිමය ස්ථානයක හෝ පිළිගත් වෙළඳපොළ මෙහෙයුම්කරුවකු විසින් මෙහෙයවනු ලබන වේදිකාවක වෙළඳාම් කරන, එම සමාගමේ".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 118 වැනි පිටුවේ 28 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

